මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல 02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :**LAE/2025/64** **2025.04.22**

# පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025.05.06
## ඡන්දය සලකුණු කිරීමේ ක්‍රියාවලිය

2025.05.06 වැනි දින පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් ඇති සියලු ම ඡන්දහිමියන් වෙත හා තැපැල් ඡන්දහිමියන් වෙත කෙරෙන දැනුම් දීමයි.

- එක් ඡන්දහිමියෙකුට එක් ඡන්දයක් පමණක් හිමි වේ. එනම් එක් ඡන්දහිමියෙකුට එක් ඡන්ද පත්‍රිකාවක් පමණක් නිකුත් කෙරේ.
- මෙම ඡන්ද විමසීමේ දී ඡන්දහිමියන්ට නිකුත් කෙරෙන ඡන්ද පත්‍රිකාවේ තරග කරන පක්ෂවල නම් හා සලකුණු ද, ස්වාධීන කණ්ඩායම් තරග කරන්නේ නම් ස්වාධීන කණ්ඩායම යන වචන ද හඳුනා ගැනීමේ අංකය හා සලකුණ ද පමණක් මුද්‍රණය කර තිබේ. අපේක්ෂකයන්ගේ හෝ කොට්ඨාසවල නම් හෝ අංක එහි සඳහන් නොවේ.

**ඡන්ද පත්‍රිකා ආදර්ශය**

| | | |
|---|---|---|
| **“අ” පක්ෂය** | * | |
| **“ආ” පක්ෂය** | * | |
| **“ඇ” පක්ෂය** | * | |
| **ස්වාධීන කණ්ඩායම 1** | * | |
| **ස්වාධීන කණ්ඩායම 2** | * | |

- ඡන්දය ප්‍රකාශ කිරීමේ දී, ඔබ කැමැති පක්ෂයේ නම, සලකුණ හෝ ස්වාධීන කණ්ඩායම යන වචන ද හඳුනා ගැනීමේ අංකය හා සලකුණ ඇති තීරුවේ සලකුණට දකුණෙන් ඇති ඉඩ කොටසේ එකම එක කතිරයක් පමණක් ( X ) සලකුණු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.
- ඡන්ද පත්‍රිකාවේ වෙනත් කිසිම සලකුණක් යෙදීමෙන්, ඇඳීමෙන් හෝ ලිවීමෙන් වැළකී සිටීම අත්‍යාවශ්‍යය. මක්නිසාද යත් එසේ කිරීම එනම්, විවිධ සලකුණු ඇඳීම, ලකුණු කිරීම ඡන්දහිමියා හඳුනා ගැනීමට උපකාරි වීම සඳහා කරන ලද උත්සාහයක් සේ සැලකිය හැකි බැවිනි.

**ඡන්දය දීම සඳහා එකම එක කතිරයක් ( X ) පමණක් භාවිත කරන්න.**

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි

**සමන් ශ්‍රී රත්නායක**
**මැතිවරණ කොමසාරිස් ජනරාල්**